ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

***

**පුවත්පත් නිවේදනය**

**ඉන්දීය ජනතාවට සුබ සිද්ධිය ප්‍රාර්ථනා කරමින් ශ්‍රී ලංකාව පුරා විශේෂ ආශිර්වාද වැඩසටහන් රැසක්**

කොවිඩ්-19 වසංගතයෙන් පීඩාවට පත්ව සිටින ඉන්දීය ජනතාවට සුබ සිද්ධිය ප්‍රාර්ථනා කරමින් 2021 මැයි 8 වන දින ශ්‍රී ලංකාව පුරා විවිධ ආගමික වැඩසටහන් රැසක් පැවැත්විණ. විවිධ ආගම්වලට අයත් මෙම ආශිර්වාදාත්මක වැඩසටහන් ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ ජනතාව අතර පවතින සහෝදරත්වයේ සහ සබඳතාවයේ සැබෑ පිළිඹිබුවක් වේ.

2. අතිගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වය යටතේ බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යාංශය පස්වරු 5.30 සිට 6.30 දක්වා දිවයින පුරා බහු ආගමික 'විශ්ව ආශිර්වාද පූජාවක්' සංවිධානය කර තිබිණ. මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මැතිතුමා ශ්‍රී ගංගාරාම විහාරස්ථානයේ පැවති විශේෂ වැඩසටහනකට සහභාගී වූ අතර එහිදී රතන සූත්‍ර සහ ජ්වර පිරිත් දේශනාවක් පැවැත්විණ. ජපාන සහ වියට්නාම තානාපතිවරුන් සහ තවත් රාජ්‍යතාන්ත්‍රිකයන් රැසක් මෙම පූජනීය අවස්ථාවට සහභාගී වූහ.

3. මහාම්‍රිතුංජය මහා යාගය ශ්‍රී ලංකාවේ ඊස්වරම් කෝවිල් පහේදීම එකම අවස්ථාවේදී පැවැත්විණ. අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා 2015 වසරේ මාර්තු මාසයේදී සිය ශ්‍රී ලංකා සංචාරය අතරතුර නගුලීස්වරම් කෝවිලට පැමිණි අතර එය සංකේතවත් කරමින් එම සංචාරයේ ඡායාරූප කෝවිල් පරිශ්‍රයේ ප්‍රදර්ශනය කර තිබිණ. නගුලීස්වරම් කෝවිලේ බලධාරීන් මෙන්ම කොන්ඩවිල් අයියප්පා සහ මාවිද්දපුරම් කන්දසාමි කෝවිල්හි බලධාරීන් ද ඉන්දියාවට සහයෝගය පළ කරමින් ජනාධිපති රාම් නාත් කෝවින්ද් මැතිතුමාට සහ අග්‍රාමාත්‍ය මෝදී මැතිතුමාට ආමන්ත්‍රණය කරන ලද ලිපි යාපනයේ ඉන්දීය කොන්සියුලර් ජෙනරාල් එස්. බාලචන්ද්‍රන් මහතාට බාර දුන්නේය.

4. යාපනයේ කතෝලික දේවස්ථානයන් ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ ජනතාව සහ සියලු ලෝවැසි ජනතාව වෙනුවෙන් පැයක දේව මෙහෙයක් පවත්වන ලදී. මෙයට සමගාමීව පෞද්ගලික නිවාසවලද විශේෂ යැදුම් පැවැත්විණ.

5. 2021 මැයි 5 දින මහ කොමසාරිස් කාර්යාලය විසින් නිකුත් කරන ලද පුවත්පත් නිවේදනයකදී මෙයට පෙර සති වලදී දිවයින පුරා පැවති මෙවන් වැඩසටහන් පිළිබඳව

සඳහන් කරන ලදී. මහ කොමසාරිස් කාර්යාලය ඉන්දියාවේ සහෝදර ජනතාව සමඟ ශක්තිමත්ව රැඳී සිටීම වෙනුවෙන් සහ මෙම දුෂ්කර සමයේදී දක්වන කාරුණිකභාවයට ශ්‍රී ලංකා සමාජයේ සියලු කණ්ඩායම් වලට හෘදයාංගම කෘතවේදීත්වය පළ කරන අතර එය මහත් සේ අගය කරයි.

*****

කොළඹ
2021 මැයි 9